# ශ්‍රී ලංකාවේ නියාමන ආයතන සහ ඒවායේ ක්‍රියාකාරීත්වය

පාර්ලිමේන්තුව විසින් විවිධ අරමුණු මූලික කරගෙන පනත් සම්පාදනය කරනු ලබයි. එලෙස සම්මත කරනු ලබන පනත් වල විවිධ විධිවිධානයන් අඩංගු වේ. එලෙස ඒ ඒ පනත් වල අඩංගු විධිවිධානයන් අදාල පාර්ශවයන් විසින් පිලිපදින බවට සහතික කිරීම සඳහා පිහිටුවන ලද රාජ්‍ය ආයතනයන් නියාමන ආයතන ලෙස හැඳින්වේ.

එවන් නියාමන ආයතන කිහිපයක් පහත පරිදි වේ.

## ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

මෙය 1959 අංක 23 දරණ වරලත් ගණකාධිකාරී ආයතනය පනත මගින් පිහිටුවා ඇත. මෙය නිත්‍ය අනුප්‍රාප්තියක් මෙන්ම පොදු නිල මුද්‍රාවක් සහිත ආයතනයකි. මෙහි සාමාජිකයන් හට "වරලත් ගණකාධිකාරී" තනතුර ලැබේ.

එහි කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ සහ විගණක ප්‍රමිතීන් සකස් කිරීම
- වරලත් ගණකාධිකාරීවරුන් ලියාපදිංචි කිරීම ඇතුලු ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ සහ විගණන ප්‍රමිතීන් සකස් කිරීම
- සාමාජිකයන්ගේ වෘත්තීය මට්ටම සහ විනය පවත්වාගෙන යාම

## ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

1995 අංක 15 දරණ ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් මෙය පිහිටුවා ඇත. මෙය නිත්‍ය අනුප්‍රාප්තියක් මෙන්ම පොදු නිල මුද්‍රාවක් සහිත ආයතනයකි. මෙම ආයතනයට, නඩු පැවරීමට සහ නඩු පැවරීමට යටත් වීමටද හැකියාව ඇත. එහි කාර්යයන් පහත පරිදි වේ.

- නිශ්චිත ව්‍යවසායන් ලෙස පනත මගින් හඳුනාගෙන ඇති ව්‍යවසායන්ගේ ගිණුම් පිලියෙල කිරීම, එලෙස පිලියෙල කල ගිණුම් මෙම ආයතනය වෙත ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීම යන කටයුතු වලදී ඒ ඒ ව්‍යවසායයන් විසින් අදාල ප්‍රමිතීන් පිලිපැද ඇත්ද යන කාරණාව අධීක්ෂණය කිරීම.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත යටතේ මෙය පිහිටුවා ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සංයුතිය

- මහබැංකු අධිපති විසින් නම් කරන ලද එහි නියෝජ්‍ය අධිපති

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
- සමාගම් ලේකම්වරයා
- වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා
- නෛතික, මූල්‍ය, බැංකු සහ ව්‍යාපාර යන ක්ෂේත්‍ර වල විශේෂඥ / දක්ෂ පුද්ගලයන් 6 ක්

එහි කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කොටස් වෙලඳපොල විධිමත් කිරීම
- කොටස් වෙලඳාමේ නියුතු කොටස් හුවමාරුකරුවන්ට, බ්‍රෝකර්වරුන්ට සහ බෙදාහරින්නන්ට බලපත්‍ර නිකුත් කිරීම
- මුදලින් පාඩු විඳින යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රධානය කිරීමේ කාර්යය සඳහා වන්දි අරමුදලක් පිහිටුවීම.
- සුරැකුම්පත් වෙලඳපොල සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම.
- සුරැකුම්පත් වෙලඳපොල සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් සේවයේ යෙදවීම
- පනත උල්ලංගනය කිරීමේ චෝදනාවන් විමර්ෂණය කිරීම
- කොමිෂන් සභාවේ අරමුණු ලඟාකර ගැනිමට අවශ්‍ය යම් ක්‍රියාවක් කිරීම

## කොලඹ කොටස් වෙලඳපොල

මෙය 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පිහිටුවා ඇති අතර, ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ගෙන ඇත. මධ්‍යම තැන්පතු පද්ධතියක්, විද්‍යුත් නිශ්කාෂණය කිරීමේ සහ නිරවුල් කිරීමේ පද්ධතියක් සහ ස්වයංක්‍රීය අලෙවි කිරීමේ පද්ධතියකින් සමන්විත මෙය දකුණු ආසියාවේ වඩාත්ම නවීකරණය වූ කොටස් වෙලඳපොලකි.

එහි කාර්යයන් පහත පරිදි වේ.

- සුරැකුම් නිතිපතා විකිණීමට, මිලදී ගැනීමට හෝ හුවමාරු කිරීමට අර්පනය කර ඇති ස්ථානයක් ( වෙලඳපොලක් හෝ හුවමාරුවක් ) මහජනතාවට සපයමින් ව්‍යාපාරය සිදු කිරීම
- ආණ්ඩුවේ ණය සඳහා ද්විතීයිත වෙලඳපොලක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම, පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.

■ කොටස් වෙළඳපොලක ව්‍යාපාරයට අදාලව රීති පරිපාලනය කිරීම සහ බලාත්මක කිරීම

■ වෙළඳපොල තොරතුරු ව්‍යාප්ත කිරීම

■ භුවමාරුව සඳහා සපයනු ලබන සේවය සඳහා ගාස් පැනවීම

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

කොළඹ නාගරික සීමාව සහ ඒ අවට වටපිටාව සංවර්ධනය කිරීමේ අරමුණින් 1978 අංක 4 දරණ පනත මගින්, මහකොළඹ ආර්ථික කොමිසම නමින් පිහිටුවනු ලැබූ ආයතනය පසුව පුලුල් බලතල සහිතව ආයෝජන මණ්ඩලය නමින් වර්තමානයේදී හැඳින්වේ.

එහි කාර්යයන් පහත පරිදි වේ.

● වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාවම ප්‍රවර්ධනය කිරීම

● ආර්ථික සංවර්ධනය සුපෝෂණය කිරීම සහ උත්පාදනය කිරීම

● ආර්ථිකයේ පදනම පුලුල් කිරීම සහ ශක්තිමත් කිරීම

● ආයෝජන දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය

● විදේශ විනිමය ඉපයීමේ මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම සහ අපනයන ආදායම ඉහල දැමීම

● රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහාය ඇතිව රට පුරා ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම

## සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව

රජයේ ආර්ථික සහ වෙළඳ ප්‍රතිපත්තීන්ට අනුකූලව අදාල පනත් යටතේ ව්‍යාපාර සහ සෙසු ආයතන ස්ථාපිත කිරීම, ඒවායේ සපල ක්‍රියාකාරීත්වය පිලිබඳව සහ අනෙකුත් වාණිජ කටයුතු සඳහා සහාය දැක්වීම පිලිබඳව විමසිලිමත් වීම සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවෙහි මෙහෙවර වන්නේය.

එහි කාර්යයන් පහත පරිදි වේ.

■ රජයේ ආර්තික සහ වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලව අදාල පනත් යටතේ ව්‍යාපාර සහ අනෙකුත් ආයතන පිහිටුවීම.

■ මෙම ආයතන වල කාර්‍යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කිරීම.

■ සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවට පවරා ඇති පනත් කිහිපයක් කාර්යක්ෂම සහ සපල ක්‍රියාකාරීත්වය, පරිපාලනය සහ බලාත්මක වීම සහතික කිරීම.

## සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ විෂය පථයට යටත් වන්නා වූ පනත්

1) 2007 අංක 7 දරණ සමාගම් පනත -

සමාගම් නීතිය සහ එහි ක්‍රියාකාරීත්වයට අදාල නිසි බලධාරියා වන්නේ සමාගම් රෙජිස්ටාර් වරයාය.

2) 1891 අංක 16 දරණ සමිති ආඥා පනත

ඉතිරි කිරීම ප්‍රවර්ධනය කිරීම, මුදල් අඟහිඟතාවයෙන් පෙලෙන අයට ආධාර දීම, අසනීව වී හෝ ආපදාවට පත්ව ඇති සාමාජිකයන්ට සහන සැලසීම සහ ඔවුන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට ප්‍රතිපාදන සැලසීම යන අරමුණු ඇතිව පිහිටුවන ලද අන්‍යෝන්‍යාධාර සුභසාධක සමිති ලියාපදිංචි කිරීම මෙමගින් සිදුවේ.

මෙහි කාර්යයන් අධීක්ෂණ කිරීමේ නිසි ු බලධාරියා වන්නේද සමාගම් රෙජිස්ටාර් වරයාය.

3) සීට්ටු ආඥා පනත

මෙම ආඥා පනත යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා නියාමනය කිරීමේ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම සමාගම් රෙජිස්ටාර් වරයා වෙත පැවරී ඇත.

4) 1987 අංක 3 දරණ ප්‍රසිද්ධ වැඩ කොන්ත්‍රාත් පනත

රජයේ ආයතනයක් මගින් පොදු වැඩ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම, පොදු වැඩ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම ආදිය පිලිබඳව මෙමගින් ප්‍රතිපාදන සලසා ඇත. පොදු වැඩ කොන්ත්‍රාත් සම්බන්ධ කරුණු විභාග කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කිරීම සම්බන්ධයෙන්ද මෙම පනත මගින් විධිවිධාන සලසා ඇත. මෙම පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ කාර්යය පවරා ඇත්තේ පොදු වැඩ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ රෙජිස්ටාර් වරයාටය.

## ශ්‍රී ලංකා රේගුව

මෙය මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන අතර රේගු ආඥා පනත සහ වෙනත් පනත් කිහිපයක් මගින් අවශ්‍ය මෙහි ක්‍රියාකාරීත්වයට අදාල ප්‍රතිපාදන සලසා ඇත. එහි කාර්යයන් පහත පරිදි වේ.

- භාණ්ඩ ආනයනය සහ අපනයනය සම්බන්ධයෙන් රීති සහ නියෝග බලාත්මක කිරීම
- නීත්‍යානුකූල වෙලඳාම සඳහා පහසුකම් සැලසීම
- රටට ඇතුලුවන ස්ථාන වලදී රට ආරක්ෂා කිරීම

- රේගු බදු ආකාරයෙන් ආදායම රැස් කිරීම සහ අනෙකුත් රාජ්‍ය අධිකාරීන් කිහිපයක් වෙනුවෙන් අනෙකුත් බදු එකතු කිරීම

- ආදායම් කාන්දුවීම් සහ අනෙකුත් වංචාවන් වැලැක්වීම

- සැකකරුවන් අත් අඩංගුවට ගැනීම හා තහනම් භාණ්ඩ රාජසන්තක කිරීම වැනි සීමිත පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම

- ආයනය අපනයන දත්ත එකතු කිරීම

- ආනයන සහ අපනයන සම්බන්ධයෙන් වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණය කිරීම

## ශ්‍රී ලංකා මහබැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව

1953 අංක 24 දරණ විනිමය පාලන පනත මගින් මෙය පිහිටුවා ඇත.

එහි කාර්යයන් පහත පරිදි වේ.

- රට තුලට සහ රටින් පිටතට විදේශ විනිමය ගලා යාම අධීක්ෂණය කිරීම

- ආයෝජනයන් සහ වෙනත් නීතිමය කාර්යන් සඳහා විදේශ විනිමය පහසුවෙන් ගලා යාම සහතික කිරීම

- විදේශ විනිමය විෂයෙහි අහිතකර සංවර්ධනයන් පාලනය කිරීම සහ වැලැක්වීම සඳහා ප්‍රමාණිකයන් හඳුන්වා දීම

- සර්ව ආර්ථික තීරණ ගැනිමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා තොරතුරු සහ දත්ත සැපයීම

- විදේශ විනිමය කලමනාකරණය සහ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රය පිලිබඳව පර්යේෂණ සිදු කිරීම භාරව කටයුතු කිරීම

- යහපර්චයන් මත කටයුතු කරන ලෙස විදේශ විනිමය ගනුදෙනු කරුවන්ට අවවාද කිරීම

## <u>ණය තොරතුරු කාර්යාංශය ( CREDIT INFORMATION BUREAU OF SRI LANKA ) ( CRIB )</u>

මෙය 1990 අංක 18 දරණ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත මගින් පිහිටුවා ඇත. එය 1995 අංක 8, 2008 අංක 42 දරණ පනත් වලින් සංශෝධනය වී ඇත. එහි කාර්යයන් පහත පරිදි වේ.

- 7(අ) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පුද්ගල බාණ්ඩ වලින් හෝ පුද්ගල මණ්ඩලයන්ගෙන් වෙලඳ, ණය සහ මූල්‍ය තොරතුරු එකතු කර ගැනීම, සැසඳීම සහ ගැලපීම

- 7(ආ) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පුද්ගල බාණ්ඩ වලින් හෝ පුද්ගල මණ්ඩලයන්ගේ ඉල්ලීම මත ණය සහ මූල්‍ය තොරතුරු සැපයීම

- ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යය භාරව කටයුතු කිරීම

- විවිධ පාර්ශවයන්ගේ ඉල්ලීම මත ණය ලකුණ ( Credit scoring ) සැපයීම.

- කාර්යාංශයේ කොටස් හිමිකරුවන් වන ණය ලබාදීමේ ආයතන සඳහා පර්යේෂණ සහ පුහුණු ව්‍යාපෘති කිරීම පිලිබඳ භාරව කටයුතු කිරීම

- රජය විසින් නියෝග කරනු ලබන්නේ නම් , චංචල දේපල වල සුරැකුම්පත් අයිතිය ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂිත ගනුදෙනු ගොනු කිරීමේ කාර්යාලයක් මෙහෙයවීම